**කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | පිළිගනිමි |

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් දේපළ පැවරීම, දැවැදි සහ පරිත්‍යාග මත අයකළ යුතු මුද්දර ගාස්තු නිසි අයුරින් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිසි අයුරින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට විධිවිධාන සැලසිය යුතුවේ. | ඔබ විසින් අනාවරණය කළ දෝෂ දැනට නිවැරදි කර ඉදිරියේදි නිසි අයුරින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට විධිවිධාන සලසා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනවලින් මිලදී ගත් පරිගණක කට්ටල සහ ඡායා පිටපත් යන්ත්‍රවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | පරිගණක කට්ටල සහ ඡායා පිටපත් යන්ත්‍ර ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |
| (ඇ) | 2018 වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.1,639,841ක් මූල්‍ය ප්‍රකාශනවල රු.2,082,066ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම් සිදුකළ යුතුවේ. | පිළිගනිමි |

### 1.3.3 අසම්භාව්‍ය වගකීම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බාහිර පාර්ශවයන්ට එරෙහිව විභාග වෙමින් පැවැති නඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| | මූල්‍ය ප්‍රකාශනවල හිඟ වරිපනම් බදු රු. 11,937,904 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණි. | හිඟ හිටි වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | ස්ථාන මාරු වී ගිය, සේවය අත්හිට වූ සහ විශ්‍රාම ගිය සේවකයන් 06 දෙනෙකුගේ ණය මුදලින් අයකර ගත යුතු රු. 51,626 ක් 1998 වර්ෂයේ සිට හිඟ හිටි වශයෙන් ඉදිරිපත් කර තිබුණි. | හිඟ හිටව පවතින සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

### 1.3.5 ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 103,644,925 ක් වූ ගිණුම් විෂය 06 කට අදාල ඔප්පු වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලියවිලි ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | පිළිගනිමි |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස ඉදිකිරීම් හා කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභාවේ කාර්යයන් ලිහිල් කිරීමේ අරමුණින්, සම්පූර්ණ වූ තීරණ ලබාගැනීමටත් සභාවේ අරමුදල්, ප්‍රතිපත්ති සැලසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පාරිසරික හා මහජන උපයෝගීතා වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර තිබුණත්, එම කමිටු විගණන දිනය වන 2020 පෙබරවාරි වන විටත් කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ සෑම කටයුත්තක් සඳහාම වෙන වෙනම කමිටු පත් කළ යුතු අතර ඒවා ක්‍රියාත්මක කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාව X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම් සහ සිදුකළ වියදම් අයවැය ඇස්තමේන්තුව සමඟ සැසඳීම් කළ යුතුවේ. | පිළිගනිමි |

### 1.4.2 බදු අවශ්‍යතාවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු වෙනුවෙන් "වැට් ඉන්වොයිසි" (VAT Invoice) ලබාගෙන නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු පිළිබඳව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | නියමිත සැපයුම් හා සේවාවන් සැපයූ සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන වැට් ඉන්වොයිසියට එකතු කළ අගය මත බදු ගෙවීම් සිදු කළ යුතුවේ. | පිළිගනිමි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.4,145,655ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,601,133 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,511,000 | 2,550,000 | 1,084,360 | 11,937,904 | 4,150,000 | 13,550,280 | 1,612,376 | 11,937,904 |
| කුලී | 9,794,900 | 9,802,900 | 5,913,416 | 1,518,226 | 13,588,600 | 6,043,392 | 4,724,363 | 1,329,028 |
| බලපත්‍ර ගාස්තු | 4,175,000 | 4,185,000 | 3,057,390 | 252,460 | 2,835,000 | 3,121,463 | 3,121,463 | -- |
| අනෙකුත් ආදායම් | 19,290,000 | 19,295,000 | 13,632,138 | 4,493,677 | 19,408,000 | 14,234,567 | 12,161,501 | 2,082,066 |
| එකතුව | **35,770,900** | **35,832,900** | **23,687,304** | **18,202,267** | **39,981,600** | **36,949,702** | **21,619,703** | **15,348,998** |

#### 2.2.2 ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දීර්ඝ කාලයක සිට පැවත එන ව්‍යාපාරික හිඟ කඩ කුලී අයකිරීම සඳහා | ඉදිරියේදී | මෙවැනි දෝෂ |

| | | | |
|---|---|---|---|
| | ස්ථාන සඳහා හිඟ කඩ කුලී රු. 943,595 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කළ යුතුවේ. | නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ආ) | සත්වඝාතකාගාර ආදායම්<br>------------------------------ | | |
| | සත්වඝාතන පනත අනුව, මීහරකුන් ඝාතනය තහනම් වුවත්, සභාවේ ඝාතකාගාරයේ මීහරක්දෙනුන් ඇතුළු සියළුම හරකුන් ඝාතනය කරනු ලැබේ. තවද,<br>(i) මස්කඩ කරුවන් ගෙන් එක් මීහරක්දෙනක් වෙනුවෙන් රු.1,500ක් අයකරනු ලැබේ.<br>(ii) ගව ඝාතනය කරනු ලබන අය වෙනුවෙන් අනුමත සේවක පුරප්පාඩුවක් පවතින නමුත් එය පිරවීමට කටයුතු නොකර ගවඝාතනය කරන්නාට එක් හරකෙකුට රු.50ක් බැගින් දෙනු ලැබේ. | සත්වඝාතන පනත අනුව සත්වඝාතන කටයුතු සිදුකළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ඇ) | වරිපනම් බදු අයනොකළ දේපළ<br>-------------------------------------- | | |
| | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින කොට්ඨාශ 14 කින් කොට්ඨාශ 08ක් සඳහා දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරීම සිදුකරනු නොලැබේ. | වරිපනම් බදු මත වට්ටම් ලබාදීම සඳහා "K" ආකෘති පත්‍ර නියමිත කාලය තුළ ජනතාව වෙත බෙදාහැරිය යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ඈ) | 1996 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ජාතික කඩදාසි නිෂ්පාදන කර්මාන්ත ශාලාවෙන් අයකළ යුතු වරිපනම් බදු රු.11,937,904ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු පිළිබඳව සමාලෝචිත වර්ෂයේ තථ්‍ය වශයෙන් අයකළ යුතු හිඟ ආදායම් ඇතුළුව නිවැරදි වටිනාකම ගිණුම්වල ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ඉ) | අංක JCB- ZA-5021 දරන යන්ත්‍රය මිලදී ගත් 2017.01.17 දින සිට 2019.09.26 දක්වා යන්ත්‍ර පැය 3274.8 ක් ක්‍රියා කර ඇති නමුත් එය පසුගිය මාස 04ක කාලයක සිට හානියට පත්වී ඇති අතර විශාල ප්‍රමාණයක මුදලක් අළුත්වැඩියා නඩත්තු කටයුතු වෙනුවෙන් වැය කරනු ලැබේ. | JCB යන්ත්‍රය මහජන ආයතනවලට භාවිතා කරන විට පාඩු සිදුනොවන අයුරින් කළමනාකරණය කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**2.2.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුළු සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.1,639,841ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණු අතර මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ආ) | මුද්දර ගාස්තු | | |
| (i) | නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධන 03 වගන්තිය අනුව ගාස්තු අයකළ යුතු වුවද, 2018 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර කොමසාරිස් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසයන් ඇතුළත අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ii) | නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන්, නැගෙනහිර පළාත් පාලන ආයතන 2008 අංක 01 දරන බදු හා ගාස්තු පැනවීම සඳහාත්, රැස්කිරීම සඳහාත් මූල්‍ය පාලන පනතේ 37 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල පැවරීමේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2017, 2018 සහ 2019 දෙසැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ ඍජුව හා ජංගම සේවාවන් මඟිනුත් අයකරනු ලැබූ අමතර මුද්දර ගාස්තු පිළිබඳව දේපල හිමියන් විසින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු ගණනය කර අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අමතර මුද්දර ගාස්තු සම්බන්ධයෙන් දේපල හිමිකරුවන් විසින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවනු ලැබූ මුද්දර ගාස්තු ගණනය කර ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (iii) | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායමකි. එසේ වුවත්, 2010-2019 කාලපරිච්ඡේදය සඳහා මුද්දර ගාස්තු රු.2,598,641 ක් විගණන දිනය වන 2019 අප්‍රේල් මාසය වන විටත් ප්‍රාදේශීය සභාවට ලැබී නොතිබුණි. මේ නිසා, මුද්දර ගාස්තු ආදායම් වාර්ෂිකව අහිමි වෙමින් පැවතුණි. | ඉඩම් විකුණුම් ගාස්තු ආදායම් වාර්ෂිකව ලබාගැනීම තහවුරු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2012 අගෝස්තු 04 දින අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් යෝජනා නැගෙනහිර පළාතේ, පළාත් පාලන අමාත්‍යාංශයට අනුමැතිය සඳහා යවා තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ අතුරු ව්‍යවස්ථා නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| **(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කටයුතු විධිමත්ව සිදු කර නොතිබුණු අතර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණ විකුණුම් වැනි සැලසුම් යෝජනා කර තිබුණි. නමුත්, මේවා හැර වෙනත් ආකාරයෙන් ආදායම් ජනිත කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත්ව කළ යුතු අතර ආදායම් ජනිත කිරීමේ සැලසුම් ක්රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| **(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක** | | |
| 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්ස්කැවේටර් යන්ත්‍රය මිලදී ගැනීමේදී මාසිකව රු. 566,000 ක ආදායම් ලබාගත හැකි බව මෙම යෝජිත සැලසුම් වාර්තාවේ සඳහන්ව තිබුණත් එලෙස ආදායම් උපයා නොතිබුණි. තවද මෙම යන්ත්‍රය 2017.08.31 සිට 2018.04.23 දක්වා පුද්ගලික අයෙකුට කුලියට ලබාදී යන්ත්‍ර පැය 491ක් භාවිතා කර තිබුණි. ඔහුගෙන් තවදුරටත් අයකළ යුතු රු.433,880ක් මාස 21ක් ඉක්ම ගොස් තිබුණත් අයකර නොතිබුණි. | යෝජිත පරිදි ආදායම් උපයාගත යුතු අතර හිඟ මුදල අයකර ගත යුතු වේ. | පිළිගිනිමි |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනවල ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වත්කම් ලේඛනවල ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**3.3.2 වාහන පාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) (i) ලීටරයක ඉන්ධන සඳහා ධාවනය කළ හැකි දුර වාර්ෂිකව යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් පරීක්ෂා කළ යුතු බවට රාජ්‍ය පරිපාලන කළමනාකරණ අමාත්‍යාංශයේ අංක EST-6/TPORT/05/3515 දරන 2016.12.29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ සඳහන් වුවත් ඒ අනුව පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂණ වාර්ෂිකව සිදුකල යුතුය. | පිළිගිනිමි |

| | | |
|---|---|---|
| (ii) මෝටර් රථ 08කට මෝටර් රථ ප්‍රවාහන පනත ප්‍රකාරව, ලියාපදිංචි කිරීමේ පොත් ලබාගෙන නොතිබුණි. | වාහන ලියාපදිංචි පොත් ලබා ගත යුතුයි. | පිළිගනිමි. |
| (iii) වාහන 23ක් සඳහා පමණක් ගමනාගමන ආදායම් බලපත්‍ර (Revenue License) ලබාගෙන තිබුණි. | වාහන ආදායම් බලපත්‍ර සෑම වාහනයකම ලබාගත යුතුයි. | පිළිගනිමි. |
| (iv) භාවිතා කළ නොහැකි, වෙනත් ක්‍රියාමාර්ගද ගත නොහැකි වාහන 09ක් පැවතුණි. | වාහන ඉවත් කිරීමට කටයුතු කලයුතුයි. | පිළිගනිමි. |
| (v) වර්ෂ කිහිපයක සිට වාහනවල වටිනාකම් තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි. | වාහනවල වර්තමාන වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගත යුතුයි. | පිළිගනිමි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත් විය යුතු වේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |